# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2093/3 - 2018 ඔක්තෝබර් මස 15 වැනි සඳුදා - 2018.10.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III වැනි කොටස - ඉඩම්

### ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පොතුකොළදෙණිය නමැති රජයේ ඉඩමේ කුරුඳු එළදාව නෙලා ගැනීමේ අයිතිය වෙන්දේසියේ විකිණීම**

1. මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති පොතුකොළදෙණිය, පොතුකොළදෙණිය හේන නැමති රජයේ ඉඩමේ තිබෙන කුරුඳු එළදාව 2018.11.16 දිනෙන් ඇරඹී 2019.11.15 දිනෙන් එක් අවුරුද්දක් අවසන් වන කාල පරිච්ඡේදය තුළ නෙලා ගැනීමේ අයිතිය මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් විසින් 2018.11.15 දින පෙ. ව. 10.00 ට අදාළ ඉඩමේ දී වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. කුරුඳු අක්කර 05, රූඩ් 03, පර්චස් 25 සඳහා ආරම්භක ලංසුව රු. 272,800.00කි. එම අවම ලංසුවට පිළිගනු නොලැබේ.

3. කිසියම් ලංසුවක් පිළිගැනීමට පෙර එම ලංසුව තැබූ තැනැත්තා වෙන්දේසිය පිළිබඳව කොන්දේසි පිළිගැනීමට එකඟ විය යුතුය.

4. සෑම ලංසු තබන්නෙකුම තමාම පැමිණ වෙන්දේසියට පෙනී සිටිය යුතුය. පැමිණිය නොහැකි නම් නියෝජිතයකු එවිය හැකි අතර ඔහු විසින් බලය පැවරීමේ ලිපි පරීක්ෂා කිරීම සඳහා වෙන්දේසියට පෙර කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

5. පිළිගනු ලැබූ ලංසුකරුවන් විසින් තම ලංසුවෙන් හරි අඩක් කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් වෙත එම අවස්ථාවේම ගෙවිය යුතුය. ඉතිරි කොටස වෙන්දේසිය පැවැත්වූ දින සිට සති දෙකක් ඇතුළත ගෙවිය යුතුය. තෝරා ගනු ලැබූ ලංසුකරුට ඉඩමේ භුක්තිය භාර දෙනු ලබන්නේ ලංසුවේ මුළු මුදල ගෙවූ පසු පමණි. ලංසුව පිළිගනු ලැබූ වහාම එම ලංසුවෙන් හරි අඩක් ගෙවීමට හෝ වෙන්දේසිය පැවැත්වූ දින සිට සති දෙකක් ඇතුළත ඉතිරි මුදල ගෙවීමට ලංසුකරු අසමත් වුවහොත් වෙන්දේසිය අවලංගු කොට යම් මුදලක් ගෙවා ඇතොත් එය රාජසන්තක කිරීමට ප්‍රාදේශීය ලේකම්ට අයිතිය තිබේ.

6. තෝරාගනු ලැබූ ලංසුකරු ප්‍රාදේශීය ලේකම් විසින් නියමකරනු ලැබූ යම් මුදලක් වෙතොත් ඇපයක් වශයෙන් තැන්පත් කළ යුතුය.

7. තෝරාගනු ලැබූ ලංසුකරුට පහත සඳහන් කොන්දේසි ඇතුළත් බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

   අ. බලපත්‍රලාභියාට ලිඛිත දැන්වීමක් මගින් මාසයක් කල්දී ප්‍රාදේශීය ලේකම් විසින් එම බලපත්‍රය ඕනෑම අවස්ථාවක දී අවසන් කළ හැකිය.

   ආ. ඉඩම සම්බන්ධ සියළු වරිපනම් හා අයබදු ද තක්සේරුව හා වියදම් ද බලපත්‍ර ලාභියා විසින් ගෙවිය යුතුය.

   ඇ. බලපත්‍රලාභියා තාවකාලික, ස්ථිර හෝ ගොඩනැගිලි නොහොත් ඉදිකිරීම් කිසිවක් නොකළ යුතුය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඇ. බලපත්‍රලාභියා විසින් ඉඩමේ ඇති සියළු මායිම් ගල් මනා තත්ත්වයෙන් තබා ගත යුතුය.

ඉ. ඉඩමේ ඇති ගස් කොළන් කැපීම,ඉවත ගෙන යෑම, කවර ආකාරයකින් හෝ ඒවාට අලාභ හානි සිදු කිරීම නොකළ යුතුය.

ඊ. මෙම ඉඩමෙන් කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම්ගේ අවසරයකින් තොරව පස්, වැලි හෝ බොරළු හෝ වෙනත් ද්‍රව්‍ය ඉවතට ගෙන යෑම නොකළ යුතුය.

උ. ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගෙන මිස බලපත්‍ර ලාභියා විසින් තමාට ඇති අයිතිය පැවරීම, අතුරුබදු දීම, උකස් කිරීම නැතහොත් වෙනත් ආකාරයකින් බැහැර කිරීම, ගනුදෙනු කිරීම නොකළ යුතුය.

ඌ. ඕනෑම අවස්ථාවක කුරුඳු ඉඩමට ඇතුල් වී පරීක්ෂා කිරීමට ප්‍රාදේශීය ලේකම්ට හෝ ඔහු විසින් බලය පවරන ලද ඕනෑම නිලධාරියෙකුට පුළුවන.

එ. බලපත්‍රය අවසන් වීමට පෙර ඉඩම සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් රජයට අවශ්‍ය වුවහොත් මසක් කල් දෙනු ලැබූ විට බලපත්‍ර ලාභියා විසින් එම සම්පූර්ණ ඉඩම නැතහොත් කොටස ප්‍රාදේශීය ලේකම්ට ආපසු භාර දිය යුතුය. එබඳු අවස්ථාවක දී ගෙවා ඇති බදු මුදලින් ක්‍රමාණුකූල මුදලක් ආපසු ලබා ගැනීමටත්, බලපත්‍රය නොගෙවී ඇති කාලපරිච්ඡේදය සඳහා ගෙවිය යුතු බදු මුදල අඩුකරවා ගැනීමටත් හැකියාව ඇත.

ඒ. බලපත්‍රලාභියා විසින් කොන්දේසි කඩකරනු ලැබුවහොත් කිසිම වන්දියක් නොගෙවා ඉඩමේ භුක්තිය වහාම ආපසු ගැනීමටත්, ඇප මුදල සම්පූර්ණයෙන් ම හෝ කොටසක් රාජසන්තක කිරීමටත් ප්‍රාදේශීය ලේකම්ට අයිතිය ඇත.

ඔ. බලපත්‍රලාභියා විසින් කරන ලද වැඩිදියුණු කිරීම් සඳහා හෝ වෙනයම් හේතුවක් නිසා හෝ රජයේ වන්දියක් ලැබීමට අයිතියක් නැත.

ඕ. කුරුඳු වගා ඉඩමේ ජල සංරක්ෂණය කර ගැනීම හා සෝදා පාළුව වැළැක්වීම සඳහා කාණු පද්ධතිය සකස් කිරීම. (18 "X 18 "කාණු කුට්ටි සහිත)

ක. වගාවේ වල් පාලනය ක්‍රමවත්ව සිදු කිරීම (අවම වසරකට වාර දෙකක් වත්)

ග. වගාවේ පාලු සිටුවීම කල යුතුය. ලොකු පැළ සිටුවීමේ දී 12"X 10 "ප්‍රමාණයේ බඳුන් ගත කර ඇති වසර 1 ½ පමණ වැඩුණු පැළ සිටුවිය යුතු අතර කුඩා පැළ සිටුවිය හැකි තැන් වල කුඩා පැළ සිටුවා නඩත්තු කිරීම.

ච. පඳුරේ මනා ලෙස වර්ධනය වූ ගසක් ඉතිරි කර පරිනත වූ ගස් අස්වනු ලෙස කැපීම හා අලුත එන කුරුඳු මොරෙයියන් වලින් දිරිමත් කිහිපයක් ඉතිරි කර අනෙක්වා ඉවත් කිරීම (නුහුරු පෑහීම) හා සෘජු කඳන් සඳහා පහුරු බැදීම සිදු කිරීම

ජ. පොහොර භාවිතය නිසි පරිදි සිදු කිරීම, කුරුඳු පොහොර මිශ්‍රණය (23 : 7: 15 ) අක්කරයකට 200 kg වසරකට දෙවරක් යෙදීම (පඳුරකට 50g – 60 g )

ට. කුරුඳු වගාවට වැළඳෙන රෝග හා පළිබෝධ සඳහා පාලන ක්‍රම අනුගමනය නිසිපරිදි සිදු කිරීම.

ඩ. වගා ඉඩමට හිරු එළිය හොඳින් වැටෙන සේ සෙවන ශාක ඉවත් කිරීම.

ණ. කුරුඳු වගා භූමියෙහි වෙනත් ස්ථිර භෝග හෝ කෙටි කාලීන භෝග වගා නොකළ යුතුය.

**උපලේඛනය**

මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාස්මුල්ල ග්‍රාම නිලධාරි වසමේ මාස්මුල්ල ගමේ පිහිටි මු.පි.මාර 704 පිඹුරෙහි කැබලි අංක 1, 2, 3න් දැක්වෙන ප්‍රමාණය වන අක්කර 08, රූඩ් 00, පර්චස් 24 ක් වූ පොතුකොළදෙණිය පොතුකොළදෙණිය හේන නැමති ඉඩමෙහි බිම් කොටසෙන් අක්කර 05,රූඩ් 03, පර්චස් 25ක් වූ කුරුඳු වගාව සහිත ඉඩම් කොටස.

**සතර මායිම් :**
*උතුරට* :- කැ.මැ.මු.පි. 27හි 13, උල්ලල ගම
*නැගෙනහිරට*:- කැ.මැ.මු.පි. 27හි 26 එජ්, 26ඒජී, 26එච්, 26ඒවී
*දකුණට*:- කැ.මැ.මු.පි. 27 හි 26ඒවී, 26, මු.පි.මාර 252/1, 252/21, 252/20
*බටහිර*:- මු.පි.මාර 252/1, 252/21, 252/20, 252/18, 252/19, කැ.මැ.මු.පි. 18බීවී 26 උල්ලල ගම

එන්. එච්. එම්. ඩබ්. ඩබ්. එන්. හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කඹුරුපිටිය.

2018 සැප්තැම්බර් මස 20 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේදී ය.

11 - 12

---

**මාතර දිස්ත්‍රික්කයේ කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි වැලිපොතහේන නැමති රජයේ ඉඩමේ කුරුඳු එළදාව නෙලා ගැනීමේ අයිතිය වෙන්දේසියේ විකිණීම**

1. මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති වැලිපොතහේන, වැලිපොතහේන දෙණිය නැමති රජයේ ඉඩමේ තිබෙන කුරුඳු එළදාව 2018.11.16 දිනෙන් ඇරඹී 2019.11.15 දිනෙන් එක් අවුරුද්දක් අවසන් වන කාල පරිච්ඡේදය තුළ නෙලා ගැනීමේ අයිතිය මාතර දිස්ත්‍රික්කයේ කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් විසින් 2018.11.15 දින පෙ. ව. 10.00 ට අදාල ඉඩමේ දී වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. කුරුඳු අක්කර 14, රූඩ් 02, පර්චස් 09 සඳහා ආරම්භක ලංසුව රු. 2,80,000කි. එම අවම ලංසුවට පිළිගනු නොලැබේ.

3. කිසියම් ලංසුවක් පිළිගැනීමට පෙර එම ලංසුව තැබූ තැනැත්තා වෙන්දේසිය පිළිබඳව කොන්දේසි පිළිගැනීමට එකඟ විය යුතුය.

4. සෑම ලංසු තබන්නෙකුම තමාම පැමිණ වෙන්දේසියට පෙනී සිටිය යුතුය. පැමිණිය නොහැකි නම් නියෝජිතයකු එවිය හැකි අතර ඔහු විසින් බලය පැවරීමේ ලිපි පරික්ෂා කිරීම සඳහා වෙන්දේසියට පෙර කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

5. පිළිගනු ලැබූ ලංසුකරුවන් විසින් තම ලංසුවෙන් හරි අඩක් කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් වෙත එම අවස්ථාවේම ගෙවිය යුතුය. ඉතිරි කොටස වෙන්දේසිය පැවැත්වූ දින සිට සති දෙකක් ඇතුළත ගෙවිය යුතුය. තෝරා ගනු ලැබූ ලංසුකරුට ඉඩමේ භුක්තිය භාර දෙනු ලබන්නේ ලංසුවේ මුලු මුදල ගෙවූ පසු පමණි. ලංසුව පිළිගනු ලැබූ වහාම එම ලංසුවෙන් හරි අඩක් ගෙවීමට හෝ වෙන්දේසිය පැවැත්වූ දින සිට සති දෙකක් ඇතුළත ඉතිරි මුදල ගෙවීමට ලංසු කරු අසමත් වුවහොත් වෙන්දේසිය අවලංගු කොට යම් මුදලක් ගෙවා ඇතොත් එය රාජසන්තක කිරීමට ප්‍රාදේශීය ලේකම්ට අයිතිය තිබේ.

6. තෝරාගනු ලැබූ ලංසුකරු ප්‍රාදේශීය ලේකම් විසින් නියමකරනු ලැබූ යම් මුදලක් වෙතොත් ඇපයක් වශයෙන් තැන්පත් කළ යුතුය.

7. තෝරාගනු ලැබූ ලංසුකරුට පහත සඳහන් කොන්දේසි ඇතුලත් බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

අ. බලපත්‍රලාභියාට ලිඛිත දැන්වීමක් මගින් මාසයක් කල්දී ප්‍රාදේශීය ලේකම් විසින් එම බලපත්‍රය ඕනෑම අවස්ථාවක දී අවසන් කළ හැකිය.

ආ. ඉඩම සම්බන්ධ සියළු වරිපනම් හා අයබදු ද තක්සේරුව හා වියදම් ද බලපත්‍ර ලාභියා විසින් ගෙවිය යුතුය.

ඇ. බලපත්‍රලාභියා තාවකාලික, ස්ථිර හෝ ගොඩනැගිලි නොහොත් ඉදිකිරීම් කිසිවක් නොකළ යුතුය.

ඈ. බලපත්‍රලාභියා විසින් ඉඩමේ ඇති සියළු මායිම් ගල් මනා තත්ත්වයෙන් තබා ගත යුතුය.

ඉ. ඉඩමේ ඇති ගස් කොළන් කැපීම,ඉවත ගෙන යෑම, කවර ආකාරයකින් හෝ ඒවාට අලාභ හානී සිදු කිරීම නොකළ යුතුය.

ඊ. මෙම ඉඩමෙන් කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම්ගේ අවසරයකින් තොරව පස්, වැලි හෝ බොරළු හෝ වෙනත් ද්‍රව්‍ය ඉවතට ගෙන යෑම නොකළ යුතුය.

උ. ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගෙන මිස බලපත්‍ර ලාභියා විසින් තමාට ඇති අයිතිය පැවරීම, අතුරුබදු දීම, උකස් කිරීම නැතහොත් වෙනත් ආකාරයකින් බැහැර කිරීම, ගනුදෙනු කිරීම නොකළ යුතුය.

ඌ. ඕනෑම අවස්ථාවක කුරුඳු ඉඩමට ඇතුල් වී පරීක්ෂා කිරීමට ප්‍රාදේශීය ලේකම්ට හෝ ඔහු විසින් බලය පවරන ලද ඕනෑම නිලධාරියෙකුට පුළුවන.

එ. බලපත්‍රය අවසන් වීමට පෙර ඉඩම සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් රජයට අවශ්‍ය වුවහොත් මසක් කල් දෙනු ලැබූ විට බලපත්‍ර ලාභියා විසින් එම සම්පූර්ණ ඉඩම නැතහොත් කොටස ප්‍රාදේශීය ලේකම්ට ආපසු භාර දිය යුතුය. එබඳු අවස්ථාවකදී ගෙවා ඇති බදුමුදලින් ක්‍රමාණුකූල මුදලක් ආපසු ලබා ගැනීමටත් බලපත්‍රය නොගෙවී ඇති කාලපරිච්ඡේදය සඳහා ගෙවිය යුතු බදු මුදල අඩුකරවා ගැනීමටත් හැකියාව ඇත.

ඒ. බලපත්‍රලාභියා විසින් කොන්දේසි කඩකරනු ලැබුවහොත් කිසිම වන්දියක් නොගෙවා ඉඩමේ භුක්තිය වහාම ආපසු ගැනීමටත් ඇප මුදල සම්පූර්ණයෙන් ම හෝ කොටසක් රාජසන්තක කිරීමටත් ප්‍රාදේශීය ලේකම්ට අයිතිය ඇත.

ඔ. බලපත්‍රලාභියා විසින් කරන ලද වැඩිදියුණු කිරීම් සඳහා හෝ වෙනයම් හේතුවක් නිසා හෝ රජයේ වන්දියක් ලැබීමට අයිතියක් නැත.

ඕ. කුරුඳු වගා ඉඩමේ ජල සංරක්ෂණය කර ගැනීම හා සෝදා පාළුව වැලැක්වීම සඳහා කාණු පද්ධතිය සකස් කිරීම. (18 "X 18 "කාණු කුට්ටි සහිත)

ක. වගාවේ වල් පාලනය ක්‍රමවත්ව සිදු කිරීම (අවම වසරකට වාර දෙකක් වත්)

ග. වගාවේ පාලු සිටුවීම කල යුතුය. ලොකු පැළ සිටුවීමේ දී 12"X 10 "ප්‍රමාණයේ බඳුන් ගත කර ඇති වසර 1 ½ පමණ වැඩුණු පැළ සිටුවිය යුතු අතර කුඩා පැළ සිටුවිය හැකි තැන් වල කුඩා පැළ සිටුවා නඩත්තු කිරීම.

ච. පඳුරේ මනා ලෙස වර්ධනය වූ ගසක් ඉතිරි කර පරිනත වූ ගස් අස්වනු ලෙස කැපීම හා අලුත එන කුරුඳු මොරයියන් වලින් දිරීමත් කිහිපයක් ඉතිරි කර අනෙක්වා ඉවත් කිරීම (නුහුරු පෑහීම) හා ඍජු කඳන් සඳහා පහුරු බැඳීම සිදු කිරීම

ජ. පොහොර භාවිතය නිසි පරිදි සිදු කිරීම, කුරුඳු පොහොර මිශ්‍රණය (23 : 7: 15 ) අක්කරයකට 200 kg වසරකට දෙවරක් යෙදීම ( පඳුරකට 50g – 60 g )

ට. කුරුඳු වගාවට වැළදෙන රෝග හා පළිබෝධ සඳහා පාලන ක්‍රම අනුගමනය නිසිපරිදි සිදු කිරීම.

ඩ. වගා ඉඩමට හිරු එළිය හොඳින් වැටෙන සේ සෙවන ශාක ඉවත් කිරීම.

ණ. කුරුඳු වගා භූමියෙහි වෙනත් ස්ථිර භෝග හෝ කෙටි කාලීන භෝග වගා නොකළ යුතුය.

**උපලේඛනය**

මාතර දිස්ත්‍රික්කයේ කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඕවිටිගමුව දකුණ ග්‍රාම නිලධාරි වසමේ ඕවිටිගමුව ගමේ පිහිටි අ.ගපි. 572 පිඹුරෙහි කැබලි අංක 465 න් දැක්වෙන ප්‍රමාණය වන අක්කර 15,රූඩ් 01,පර්චස් 08 ක් වූ

වැලිපොතේහේන, වැලිපොතේහේනෙදෙනිය නැමැති ඉඩමෙහි බිම් කොටසෙන් අක්කර 14,රූඩ් 02,පර්චස් 09 ක් වූ කුරුඳු වගාව සහිත ඉඩම් කොටස.

**සතර මායිම්:-**

*උතුරට* :- උල්ලල ගම් මායිම,වැලිපොතේ හේන ආර,අංක 325 ඊ ,325 සහ 325 ඩී දරණ කැබලි .

*නැගෙනහිරට*:- 325 ඊ,කැ.මැ.මු.පි. 27 හී අංක 24, 23 බී, 23 ජී, 23 එෆ්,23 ඩී,23 ජේ,23 කේ,23 එල්,23 යූ දරන කැබලි.

*දකුණට*:- කැ.මැ.මු.පි. 27 හී කැබලි අංක 23 එෆ්,23 අයි,23 ජේ,23 කේ,23 එල්,23 යූ සහ උල්ලල ගම ගම්මායිම.

*බටහිර*:- කැබලි අංක 325 ½ , 325 සහ උල්ලල ගම ගම්මායිම.

චින්තක අබේවික්‍රම,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කිරින්ද - පුහුල්වැල්ල.

2018 සැප්තැම්බර් මස 20 වැනි දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේදී ය.

11 - 13

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.